48357



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

**නාට්‍ය හා රංග කලාව I, II**
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

**2019.12.10 / 1300 - 1610**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ ඇසුරෙන් අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) කපුරාළ : "ගුරුන්නාන්සේ, අර කියපු විදියට අපි ගියා ඇතෙක් හොයන්න. ඒත් වැඩි වෙලා යන්න ඉස්සර අපට තිබහ දැනුණා. අනේ ගුරුන්නාන්සෙ, වතුර බින්දුවක් නෑ කොහේවත්. මම කොට්ටෝරුවා පිටත් කරලා වතුර ටිකක් ගේන්නෙයි කියල එතන වාඩිවෙලා උඩ බැලුවා"

(B) ත්‍රෛලෝක්‍ය සුපූජිත සකල බඹ සුරනරන් සැදූ මත පාකම ල්
ත්‍රෛකාල වර්තිත වූ හේතු ප්‍රත්‍ය ධර්ම ස්වයම්භූ ඥානයෙන් දත් සිය ල්
ත්‍රෛමූල පාපාන්ධකාරයන් නසන ප්‍රතිපත්ති මග දෙසූ නිම ල්
ත්‍රෛවාර සකස් කොට භක්ති ප්‍රේමාදරෙන් මුනිඳු නමදිමු කුමු ල්

(C) ගුරුන්නාන්සේ: දොඩවන බාසාවක් නැද්ද කියලයි අහන්නෙ.
බමුණා: දේව බාසං අත්ථි. මේ මනුස්සානං නත්ථි. මේ තෙලිඟු බාසායං අත්ථි.

(D) සොක්කා එන්නේ දෙවනුව නැටුම් නටන්නේ
දැක්කා උන්නේ සෙල්ලම් යසයි කියන්නේ
බක්කා ඉන්නේ නැටුමට මමයි කියන්නේ
සොක්කා දන්නේ නැටුමට බිම පෙරළෙන්නේ

**1.** උඩරට පැරණි ගැමි නාටකයක් හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**2.** ගම්මඩු ශාන්තිකර්මය හා සම්බන්ධ ව ඇත්තේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**3.** සූනියම් යාගය හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**4.** ඔපෙරාවක මූලික අංගය වන්නේ කුමක් ද?
(1) නර්තනය (2) ගායනය (3) රංගාලෝකය (4) රංග වින්‍යාසය

[දෙවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK
EXAMMOOD.LK

5. නාට්‍ය කලාව සෙසු ප්‍රාසංගික කලාවන් ගෙන් වෙනස් වන්නේ පහත දැක්වෙන කුමන අංගයක් යොදාගන්නා බැවින් ද?
(1) වේශභූෂණ (2) රංගාලෝකය (3) සතර අභිනය (4) රංගභූමි අලංකරණය

6. නෘත්‍ය යනු,
(1) අංග වික්ෂේප පමණක් ඇති රිද්මයානුකූල නැටුමකි.
(2) කිසියම් අර්ථයක් දැක්වෙන තාලාන්විත නැටුමකි.
(3) අංග වික්ෂේප පමණක් ඇති තාලාන්විත නැටුමකි.
(4) කිසියම් කතා පුවතක් නිරූපණය කරන රැඟුම් ප්‍රභේදයකි.

7. ප්‍රාසංගික කලා ගණයට අයත් වන කාණ්ඩය තෝරන්න.
(1) සංගීත සන්දර්ශන, චිත්‍රපට දර්ශන, ඔපෙරා, ඉඟිනළු
(2) නර්තන දර්ශන, සංගීත සන්දර්ශන, ඔපෙරා, මුද්‍රානාට්‍ය
(3) චිත්‍ර ප්‍රදර්ශන, වේදිකානාට්‍ය, මුද්‍රානාට්‍ය, බැලේ
(4) වේදිකානාට්‍ය, ඔපෙරා, වීඩියෝ දර්ශන, ගීතනාටක

8. නාට්‍යයකට සංගීතය සැපයීමේ දී වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
(1) වාදන වෘන්දයේ සංඛ්‍යාව කෙරෙහි ය.
(2) පෙරදිග හා අපරදිග සංගීත භාණ්ඩ එක සමාන ව යොදාගැනීම කෙරෙහි ය.
(3) තේමාවට හා ශෛලියට ගැළපෙන අයුරින් නිර්මාණය කිරීමට ය.
(4) ප්‍රේක්ෂකයන් ගේ රුචිකත්වයට අනුව නිර්මාණය කිරීමට ය.

9. සංවාද, අංග චලන, ශෝකී බව, නාට්‍යෝපකරණ යනාදියට අදාළ අභිනය සතර පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
(1) වාචික, ආංගික, සාත්ත්වික, ආහාර්ය (2) සාත්ත්වික, ආංගික, වාචික, ආහාර්ය
(3) වාචික, සාත්ත්වික, ආංගික, ආහාර්ය (4) ආංගික, ආහාර්ය, වාචික, සාත්ත්වික

10. ලෝකධර්මී නාට්‍යයක ලක්ෂණයක් සේ සැලකෙන්නේ,
(1) රඟපෑම අතිශයෝක්තියෙන් යුතු ව ඉදිරිපත් කිරීම යි.
(2) සැබෑ ලෝකයට සමාන අයුරින් අභිනය පෑම යි.
(3) ප්‍රකෘති ලෝකය කාල්පනික විලාසයකින් මවා පෑම යි.
(4) සිදුවීම් ශෛලිගත ආකාරයට ඉදිරිපත් කිරීම යි.

11. නාට්‍යයක් රඟ දක්වන විට අනිවාර්යයෙන් ම සිටිය යුත්තේ කවුරුන් ද?
(1) නාට්‍ය අධ්‍යක්ෂවරයා සහ නළු-නිළියන් (2) නළු-නිළියන් සහ ප්‍රේක්ෂකයන්
(3) ප්‍රේක්ෂකයන් සහ ගායන ශිල්පීන් (4) ගායක ශිල්පීන් සහ නළු-නිළියන්

12. පින්තූර රාමු වේදිකාවකට මූලික වශයෙන් රංගාලෝකය අවශ්‍ය කුමක් සඳහා ද?
(1) දර්ශනය විචිත්‍රවත් කරගැනීමට
(2) වේදිකාවේ වර්ණ වෙනස් කිරීමට
(3) මනා ප්‍රේක්ෂාවක් ඇති කරගැනීමට
(4) අඳුර දුරු කරගැනීමට

13. වේශභූෂණ නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ නාට්‍යයේ,
(1) රංග කාලය යි. (2) රංග ශෛලිය යි. (3) රංග ආකෘතිය යි. (4) චරිත සංඛ්‍යාව යි.

14. අංගරචනා ශිල්පියා නළුවන් අංගරචනය කිරීමට පෙර,
(1) පදනම් ආලේපය මුහුණේ තැවරිය යුතු ය. (2) මුහුණට ගැළපෙන වර්ණ තෝරාගත යුතු ය.
(3) මුහුණ මත රේඛා ලකුණු කරගත යුතු ය. (4) පූර්ව-සැලසුම් චිත්‍ර ඇඳගත යුතු ය.

15. අභිරූපණ රංගනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අංග දෙක කුමක් ද?
(1) ආංගිකාභිනය සහ වාචික අභිනය
(2) සාත්වික අභිනය සහ රංග භූමි අලංකරණය
(3) අංග රචනය සහ නාට්‍යෝපකරණ
(4) ආංගිකාභිනය සහ සාත්වික අභිනය



EXAMMOOD.LK EXAMMOOD.LK

**16.** රංග වින්‍යාසය යනු වේදිකා අවකාශය තුළ නළු-නිළියන්
(1) රංගනයේ යෙදවීම යි.
(2) ස්ථානගත කරවන ආකාරය යි.
(3) ගමන් කරවන ආකාරය යි.
(4) රිද්මයානුකූල ව චලනය කරවීම යි.

● පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **නාට්‍යයේ නම** | **රචකයාගේ නම** | **පරිවර්තනය/ අනුවර්තනය** | **මෙරට නිෂ්පාදක/ පරිවර්තක** |
|---|---|---|---|
| A | මැක්සිම් ගෝර්කි | හිරු නැති ලොව | රංජිත් ධර්මකීර්ති |
| යෙර්මා | ගාර්ෂියා ලෝර්කා | B | ගුණසේන ගලප්පත්ති |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හිත හොඳ අම්මණ්ඩි | C |
| ද ග්ලාස් මෙනාජරි | D | අහස් මාලිගා | හෙන්රි ජයසේන |

**17.** ඉහත වගුවේ A කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) වේටිං ෆෝ ගොඩෝ
(2) ඇපල් කාර්ට්
(3) රන් ෆෝ යුවර් වයිෆ්
(4) ද ලෝවර් ඩෙප්ත්ස්

**18.** ඉහත වගුවේ B කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන නාට්‍යයේ නම කුමක් ද?
(1) උත්තමාවි (2) ලියතඹරා (3) මූදු පුත්තු (4) දේවතා එළි

**19.** ඉහත වගුවේ C කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක ගේ නම කුමක් ද?
(1) සුගතපාල ද සිල්වා
(2) බන්දුල ජයවර්ධන
(3) දයානන්ද ගුණවර්ධන
(4) සයිමන් නවගත්තේගම

**20.** ඉහත වගුවේ D කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය රචකයා කවු ද?
(1) බර්නාඩ් ෂෝ (2) ටෙනසී විලියම්ස් (3) ප්ලෝටස් (4) ඇන්ටන් චෙකෝව්

**21.** ගගනිකාවේ සඳක් මවා පෙන්වීමට අවශ්‍ය කරන පහන කුමක් ද?
(1) ධාරාලෝක පහන
(2) අල්ට්‍රා වයලට් පහන
(3) ප්‍රක්ෂේපණ තිත් පහන
(4) හැලොජන් පහන

**22.** ශරීරාංග සැහැල්ලු කිරීමට උපකාර වන්නේ කුමක් ද?
(1) ශිථිලකරණ අභ්‍යාස
(2) ශ්වසන අභ්‍යාස
(3) සංවේදන අභ්‍යාස
(4) කටහඬ අභ්‍යාස

**23.** නාට්‍ය පෙළ රචනයේ දී,
(1) ගීත මගින් පරිසරය පමණක් වර්ණනා කළ යුතු ය.
(2) චරිත නොවෙනස් වන අයුරින් නිරූපණය කළ යුතු ය.
(3) හැමවිට ම කතාවේ මුල මැද අග සිද්ධි අනුපිළිවෙළට තිබිය යුතු ය.
(4) චරිතවල අරමුණු හෙළිවන ආකාරයට සංවාද සැකසිය යුතු ය.

**24.** නාට්‍යෝපකරණ සැදිය යුත්තේ,
(1) දීප්තිමත් වර්ණ හා චිත්තාකර්ෂණීය බව සලකා ය.
(2) දිලිසෙන සුළු වර්ණවත් අමුද්‍රව්‍යවලින් ය.
(3) පහසුවෙන් අඩු මිලට ලබාගත හැකි අමුද්‍රව්‍යවලින් ය.
(4) නළුවන් ගේ රංග කාර්යයට උපකාර වන ආකාරයට ය.



EXAMMOOD.LK EXAMMOOD.LK

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **25** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

**25.** ගුණසේන ගලප්පත්තිගේ මූදු පුත්තු නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** රංග රචනය සම්බන්ධ ව ප්‍රවීණතාව උසුලන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**27.** මනමේ නාට්‍ය ප්‍රථම නිෂ්පාදනය හා සම්බන්ධ වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.


**28.** ඉහත සඳහන් ඡායාරූප අතුරෙන් මේස, මෝදර මෝල වැනි නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.


**29.** ලොව වඩාත් ප්‍රකට අභිරූපණ ශිල්පියකු ලෙස නම් දරා සිටින්නේ,
(1) රොබට් ඩී. නීරෝ ය. (2) ලියනාඩෝ ඩී කැප්රියෝ ය.
(3) රෝවන් සෙබස්ටියන් ය. (4) මාර්ෂල් මාෂොව් ය.

**30.** විශ්වනාත් ලෞජි විසින් සංගීතය සපයන ලද නූර්තිය කුමක් ද?
(1) වෙස්සන්තර (2) දුටුගැමුණු (3) ශ්‍රී වික්‍රම (4) සිරිසඟබෝ

**31.** කෝලම් නාටකයක අපර රංගය ආරම්භ වන්නේ,
(1) රජු හා බිසව ගේ සම්ප්‍රාප්තියත් සමග ය.
(2) හේවා කෝලම සබයෙන් නික්මයාමත් සමග ය.
(3) අණ බෙර කෝලම සබයට පිවිසීමෙන් අනතුරු ව ය.
(4) මල් පැළ පහන් දැල්වීම සහ දේවාරාධනා කවි ගායනයෙන් පසු ව ය.

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් අංක **32** සිට **33** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B

**32.** A හා B යන වෙස් මුහුණු අනුපිළිවෙළින්,
(1) සන්නි මුහුණක් හා කෝලම් මුහුණකි. (2) කෝලම් මුහුණක් හා සන්නි මුහුණකි.
(3) සන්නි මුහුණු දෙකකි. (4) කෝලම් මුහුණු දෙකකි.

**33.** ඉහත වෙස් මුහුණු අතුරෙන් එක් වෙස් මුහුණකින් සංකේතවත් කරන ආබාධය කුමක් ද?
(1) පාචනය (2) අන්ධ බව
(3) උණසන්නිපාතය (4) බිහිරි බව

**34.** නළුවකු විසින් කිසියම් රඟපෑමක් සාර්ථක ව ඉදිරිපත් කිරීමට නම් පිටපත කියවා,
(1) රංග විධාන ඒ අයුරින් ම පිළිපැදිය යුතු ය.
(2) චරිතයේ භූමිකා හඳුනාගත යුතු ය.
(3) රංග අභ්‍යාස ප්‍රගුණ කළ යුතු ය.
(4) වේෂභූෂණ හා අංග රචනය ගැන සැලකිලිමත් විය යුතු ය.



EXAMMOOD.LK

48357

**35.** දික්තල කාලගෝල නාට්‍යයේ සංවාද උච්චාරණය කළ යුත්තේ,
(1) සාමාන්‍ය ජීවිතයේ මිනිසුන් කතාබහ කරන ආකාරයෙනි.
(2) සොකරි නාටකයේ කවි ගායනා කරන විලාසයෙනි.
(3) කිසියම් රිද්මයකට අනුව ශෛලිගත ස්වරූපයෙනි.
(4) ලෝකධර්මී ශෛලියට අනුව ය.

**36.** කැරකෙන වේදිකාවක් දක්නට ඇත්තේ,
(1) ග්‍රීක ඇරීනා රංග භූමියේ ය.
(2) එංගලන්ත ග්ලෝබ් රඟහලේ ය.
(3) ජපන් කබුකි වේදිකාවේ ය.
(4) කොළඹ නෙළුම් පොකුණ රඟහලේ ය.

**37.** කෙටි නාට්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,
(1) ජවනිකා ගණනාවකින් යුක්ත වීම යි.
(2) නාට්‍යෝපකරණ කිසිවක් නොයොදා ගැනීම යි.
(3) රංග වින්‍යාසය උපරිම අයුරින් යොදාගැනීම යි.
(4) බොහෝ විට එක් අංකයකට පමණක් සීමා වීම යි.

- පහත සඳහන් නාට්‍ය හය ඇසුරෙන් අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දෙවැනි මහින්ද
B - වෙද හටන
C - පිටිසර කෙල්ල
D- වැරදුණු කුරුමානම
E - කපුවා කපෝති
F- කඩවුණු පොරොන්දුව

**38.** සිරිසේන විමලවීර ගේ නාට්‍ය නිර්මාණයක් වන්නේ කුමක් ද?
(1) A (2) B (3) C (4) D

**39.** මිනර්වා නාට්‍යවලට අයත් වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) D හා E පමණි. (4) D හා F පමණි.

**40.** ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල සමිතිය විසින් රඟ දක්වනු ලැබූ නාට්‍ය වන්නේ,
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) B හා E පමණි. (4) D හා E පමණි.

* *



EXAMMOOD.LK EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**50 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

**නාට්‍ය හා රංග කලාව I, II**
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(i) විකෘති නාට්‍යයේ ඇතුළත් දර්ශන සංඛ්‍යාව කීය ද? (ලකුණු 02 යි)
(ii) මෙම නාට්‍යයේ කතාව ගලායන කාල සීමාව වසර කීය ද? (ලකුණු 02 යි)
(iii) ප්‍රියංගනී දක්ෂතා දක්වන හැකියාවන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(iv) විකෘති නාට්‍යයේ දර්ශන සිදුවන ස්ථාන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(v) අවසාන ජවනිකාවේ ඇතුළත් නිශ්චිත පුද්ගල නාම නැති චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(vi) විකෘති නාට්‍ය පෙළ රචනයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**2.** (i) නාට්‍යමය ලක්ෂණ ඇති පහතරට ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) එම ශාන්තිකර්ම පවත්නා ප්‍රදේශ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) ඉහත (i) හි සඳහන් කරන ලද ශාන්තිකර්මයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) රඟපෑම පුහුණු වීමේ දී නළු-නිළියන් විසින් ප්‍රගුණ කළ යුතු අංග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) රූපණ ශිල්පියකුට අවශ්‍ය ගුණාංග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) 'රූපණය' යනු කුමක් දැ යි ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) අංගරචනයේ මූලික කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) අංගරචනා ශිල්පීන් භාවිත කරන අමුද්‍රව්‍ය **දෙකක්** සහ උපකරණ **දෙකක්** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) නාට්‍ය රඟ දැක්වීමේ දී අංගරචනය අවශ්‍ය වන්නේ ඇයි දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) සොකරි රඟ දැක්වෙන ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) සොකරි නාට්‍යයේ ඇතුළත් වන ප්‍රධාන චරිත **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) සොකරි නාටකයේ රංග ශෛලිය කරුණු **තුනක්** යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) හෙන්රි ජයසේන රංගනයෙන් දායක වූ වේදිකා නාට්‍යයක නම හා ඔහු රඟ පෑ චරිතය සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) හෙන්රි ජයසේන නිෂ්පාදනය කළ ස්වතන්ත්‍ර නාට්‍ය **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) හෙන්රි ජයසේන ගෙන් දේශීය නාට්‍ය කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

**7.** පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

චතුරි විද්‍යා විෂයන් ඉගෙනගැනීමට කැමති ය. ඇගේ බලාපොරොත්තුව අනාගතයේ වෛද්‍යවරියක වීම යි. චතුරි ගේ නංගි සෙනුරි සංගීතයට සහ නර්තනයට දක්ෂ ය. ඇගේ බලාපොරොත්තුව කලා අංශයෙන් ඉගෙනගෙන ගුරුවරියක වීම යි. තාත්තා සෙනුරිට විද්‍යා අංශයෙන් ඉගෙන ගන්නා ලෙස බල කරයි. අම්මා සෙනුරි ගේ කැමැත්තට පක්ෂ ව කතා කරයි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

* * *

EXAMMOOD.LK